# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,186 — 1960 අගෝස්තු 26 වැනි සිකුරාදා — 26.8.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය – පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 647 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 650 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 650 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාගිරාදිය විකිණීම ... ... | 662 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් " ඇප තැබීම කළ යුතුය " යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන " නවප්‍රවේශක නිලධාරීන් " සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) " නවප්‍රවේශක නිලධාරීන් " ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් " ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත " යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ කිසි බලධාරිහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

මගේ අංකය : 1/30/3(ජී).

## ශ්‍රේෂ්ඨාධිකරණයේ භාෂා පරිවර්තක තනතුර

ශ්‍රේෂ්ඨාධිකරණයේ භාෂා පරිවර්තකයකු වශයෙන් මාරු කිරීම සඳහා සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ 2 වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

අනෙක් උසාවිවල භාෂා පරිවර්තකයකු වශයෙන් ඇති පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ. ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඒවා 1960 සැප්තැම්බර් 9 වැනි දිනට හෝ ඊට ප්‍රථම භාණ්ඩාගාරයට ලැබිය යුතු ය.

ග. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 අගෝස්තු 22 දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ අභ්‍යාස විද්‍යාලයන්හි අභ්‍යාස ආචාර්ය තනතුර

බලපිටියේ රජයේ අභ්‍යාස විද්‍යාලයේ අභ්‍යාස ආචාර්ය තනතුර සඳහා 1960 සැප්තැම්බර් මස 16 වැනි දින තෙක් කොම්පොඤ්ඤ වීදියේ, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ " ටීසී " ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

**2. වැටුප් ක්‍රමය.**—මේ තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,060—7×120, 8×180 සහ 2×240—5,820 වේ.

**3. අවශ්‍ය අධ්‍යාපන හා අනික් සුදුසුකම්—**

(i) ඉල්ලුම්කරු උපාධිධරයකු වී ඉන්පසු තෙවසක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින්නකු හෝ ද්විතීයික ගුරු පුහුණුවක් ලැබ සිටින්නන් යටත්පිරිසෙයින් පස්වසක ඉගැන්වීමේ පළපුරුද්දක් පුහුණුවීමෙන් පසු ලබා සිටිය යුතු ය. ඉල්ලුම්කරු සිංහල භාෂාවෙන් මනා සුදුසුකම් ලබා ප්‍රජාචාරය, බුද්ධාගම, සිංහල භාෂාව හා සාහිත්‍යය ඉගැන්වීමෙහි ප්‍රවීණ විය යුතු ය.

(ii) 1960.9.16 වැනි දිනට ඉල්ලුම්කරුවන් වයසින් අවුරුදු 25 ට අඩු හෝ 50 ට වැඩි හෝ නො විය යුතු යි. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් ළපරිම වයස් සීමාව නො යෙදේ.

**4. විශේෂ කොන්දේසි—**

(i) තෝරා ගනු ලබන ඉල්ලුම්කරු පළමුවරට බලපිටියේ අභ්‍යාස විද්‍යාලයට පත් කරනු ලැබුවද ස්ථාන මාරුකර යැවීමට යටත් ය.

(ii) පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුකූලව නියමිත ෆෝරමයෙහි ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම් පත්‍ර ෆෝරම මෙම කාර්යාලය මගින් සැපයනු නො ලැබේ. එහෙයින් දැන්වීමෙහි පලකර තිබෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපතක් ඉල්ලුම්කරු විසින් පිළියෙළ කරගත යුතු ය. ඉල්ලුම්පත් දැනට සේවය කරන සේව්‍යයා භාරයේ එවිය යුතු යි.

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු පත් කරනු ලැබුව හොත්, ඔහු මෙම තනතුර දරන තෙක්, මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡෙදයේ පටන් ගැන්මේ පලකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය ටීසීඒ. 7877
1960 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, මලසි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ ෆෝරමය

**බලපිටියේ රජයේ අභ්‍යාස විද්‍යාලයේ අභ්‍යාස ආචාර්ය තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1960.9.16 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :—— මාස :—— දින :——.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඉ) ඔහුගේ පිය පාර්ශවයේ මුත්තා :————.

(ඊ) ඔහුගේ " " මීමුත්තා :————.

6. ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතු ය.)

7. වෘත්තීය සුදුසුකම් :————.

8. ඉගනීම ලැබූ පාසැල හා විද්‍යාල (ඇතුළත් වූ හා අස් වූ දින සඳහන් කළ යුතු ය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න් :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුළත් වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුරු | සේවා කාලය අ. මා. දින | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

10. සිංහල භාෂාවෙන් ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල—සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ). ඇමිණිය යුතු ය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා විසින් ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා පත් කිරීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව, මා රාජකාරියෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## කලුතර දිස්ත්‍රික්කයේ මහගම සංචාරක බංගලා භාරකාර තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස කලුතර දිස්ත්‍රික්කයේ ඒජන්ත තැන විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 288ක් වේ. ආණ්ඩුවේ රෙගුලාසි අනුව තාවකාලික ජීවන දීමනාවක් ද ගෙවනු ලැබේ. මේ වැටුපට සහ ජීවන දීමනාවට අතිරේක වශයෙන් පහත සඳහන් දීමනා වන් ද තෝරා පත්කරගනු ලබන තැනැත්තාට ගෙවනු ලැබේ.

(1) රෙදිපිළි සේදීම සඳහා දීමනාවකට මසකට රු. 1.

(2) කසල සෝදන දීමනාව සඳහා මසකට රු. 1.

3. අයදුම් කරුවන් ලාංකිකයන් විය යුතුය. 1960 සැප්තැම්බර් මස 6 වෙනි දිනට අයදුම් කරුගේ වයස අවුරුදු 25ට අඩු නො විය යුතුය. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ තානායම් පලවල් හෝ සංචාරක නිවාසවල හෝ වෙනත් ආහාර සපයන ස්ථාන පාලනය කිරීම පිළිබඳව පළපුරුද්දක් ඇති අය පමණකි. සිංහල සහ දෙමළ හෝ කියවීමට සහ ලිවීමටද, ඉංග්‍රීසි කථා කිරීමට හා තෝරා ගැනීමටද, හැකි වූ ඉල්ලුම් කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. දේශීය හා බටහිර කෑම වර්ග පිළියෙල කිරීමේ සමත්කම අවශ්‍යතම සුදුසුකමකි. තවද ගණන් තැබීමේ පළපුරුදු කෙනෙක් විය යුතුයි.

4. තෝරාගනු ලබන අයදුම්කරු 3 අවුරුද්දක අස්ථිර කාලයක් ගත කළ යුතුයි. තවද ඔහු ආණ්ඩුවේ සෑම ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට යටත් වන්නේ ය.

5. තෝරාගනු ලබන අයදුම්කරු රු. 750ක ඇපයක් තැබිය යුතුය. මේ ඇප මුදල පත්වූ වහාම රු. 250ක මූලික තැන්පත් මුදලකින් හා ඉතිරි කොට මසකට රු. 10 බැගින් ගෙවිය යුතු වේ.

6. අයදුම්කරු විසින් මෙහි පහත සඳහන් ලියකියවිලි වල පිටපත් තම ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (අංක බී. 78 ඒ දරණ පෝර්මයෙහි)
(ii) අධ්‍යාපන සහතික පත්‍ර
(iii) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක්.

7. ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම් පත් සලකා බලනු ලබන්නේ ස්වකීය දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කලොත් පමණී.

8. අයදුම්කරුවකු ගැන නිර්දේශ කිරීමට අදහස් කරන අයෙකු සහතිකයක් දීමෙන් එසේ කළ යුතුයි. අනියම් ලෙස උදව් සෙවීම හෝ පොළඹවා ගැනීමට තැත් කිරීම අයදුම්කරුවෙකු නුසුදුස්සෙකු කිරීමට හේතු වේ.

9. තෝරා ගැනීමට පෙර අයදුම් පත්‍රයෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය බව පෙනී ගියහොත් එයින් ම එකී අයදුම්කරුවා නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරා ගැනීමෙන් පසු එවැන්නක් අනාවරණය වුවහොත් ඔහු රාජකාර්යයෙන් පහකර දැමීමට සිදු වේ.

10. අයදුම් කරුවන් නියම කරණ දිනයක සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් කිසිම වියදමක් හෝ ගෙවනු නොලැබේ.

11. මෙහි පහත දැක්වෙන ආකෘතියේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම්පත් 1960 සැප්තැම්බර් මස 6 වෙනි දිනට හෝ ඊට පෙර පුද්ගලික මගේ නමට නොව "කලුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන, කලුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

ඩබ්ලිව්. පතිරණ,
ආණ්ඩුවේ ඒජන්ත තැන.

1960 අගෝස්තු මස 17 වෙනි දින,
කලුතර කච්චේරියේදීය.

**කලුතර දිස්ත්‍රික්කයේ මහගම සංචාරක බංගලා භාරකාර තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයෙක්ද නැද්ද යන වග සඳහන් කළ යුතුයි) : ————.

(4) අයදුම් කරුගේ උපන් දිනය සහ ස්ථානය :————.

(5) අයදුම් කරුගේ පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.

(6) විවාහකද අවිවාහකද යන වග :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් සහ අවසාන වරට සමත් වූ විභාගය හා දිනය :————.

(8) ඉගෙනීම ලැබූ ස්ථානය සහ පාසැලින් අස් වූ දිනය :————.

(9) (අ) පාසැලින් අස් වූ පසු නිරත වූ රක්ෂා හා වකවානු සහ වෘත්තීය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

(ආ) මීට ඉහත රජයේ රක්ෂාවක නිරතව සිටියේ නම් ඉන් අස්වීමට හේතුවූ කරුණු සහ සම්පූර්ණ විස්තර :————.

(ඇ) තානායම් භාරකරුවකු සේ රජය යටතේ හෝ පළාත් පාලන සේවා මෙහෙය යටතේ සේවය කර තිබේ නම් : ————.

(ඈ) (i) දැන් දරණ තනතුර, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය : ————.

(ii) වර්තමාන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) දින සහිත රැකී රක්ෂා පිළිබඳ වාර්තාව :————.

(10) සිංහල හා දෙමළ කියවීමට, ලිවීමට හා අවබෝධ කර ගැනීමට ඇති දක්ෂතාවය :————.

(11) විශේෂ සුදුසුකම් පිළිබඳව විස්තර :————.

(12) චරිත සහතික පත් ලබාගත් අයගේ නම සහ දරන තනතුරු : ————.

(13) තානායම් හා සංචාරක බංගලා වැඩ ගැන ලබා ඇති පළපුරුද්ද හෝ වෙනත් සුදුසුකම් :————.

(14) ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් නීති උසාවියකින් වරද කරුවකු වී තිබේ නම් එහි දිනය, නඩු අංකය සහ කෙබඳු අපරාධයක්දැයි සඳහන් කරන්න :————.

(15) ණය ගනුදෙනු වලින් හා මුදල් සම්බන්ධ කරදර වලින් නිදහස් අයෙක්ද යන වග :————.

(16) මුදල් තත්ත්වය :————.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සිවිල් නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය

සිවිල් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණයක් 1960 ඔක්තෝබර් මස පහත පළවෙන දිනයන් හිදී පැවැත්වේ:—

| | | |
|---|---|---|
| ඔක්තෝබර් 18 වැනි අඟහරුවාද... | නීතිය | සිවිල් සේවයේ සහ විදේශ සේවයේ යෙදී සිටින්නන් විසින් මෙ දිනවල මෙම විෂයන් ගන්නවා ඇත. |
| ඔක්තෝබර් 20 වැනි බ්‍රහස්පතින්ද | නීතිය | |
| ඔක්තෝබර් 21 වැනි සිකුරාද ... | සිංහල, ලිඛිත* | |
| ඔක්තෝබර් 22 වැනි සෙනසුරාද... | දෙමළ, ලිඛිත* | |
| ඔක්තෝබර් 24 වැනි සඳුද ... | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති සහ පාලන රෙකුලාසි: ගණන් තැබීම | |
| ඔක්තෝබර් 25 වැනි අඟහරුවාද | නීතිය (අනෙක් නිලධාරීන් සඳහා) | |
| ඔක්තෝබර් 26 වැනි බදාද ... | සිංහල (වාචික) | |
| ඔක්තෝබර් 27 වැනි බ්‍රහස්පතින්ද | දෙමළ (වාචික) | |

(*මේ කාල සටහන් වෙනස් කිරීමට ඉඩ තිබේ.)

වර්ෂ 1956යේ සැප්තැම්බර් මාසයේ 24 වැනි දිනයට පසු සිවිල් සේවයට බඳවා ගන්නා අය විසින් ගත යුතු ලංකා සිවිල් සේවා ව්‍යවස්ථාවේ 20 වැනි වගන්තිය යටතේ දක්වා ඇති, සිංහල ප්‍රශ්න පත්‍රය පහත දැක්වෙන කොටස් දෙකෙකින් සමන්විත වේ:—

(1) භාෂාව සහ රචනය ... පැය 3 යි

(2) පරිවර්තනය ... පැය 3 යි

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරීන්, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කැලෑ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්, සහකාර ආහාර පාලක නිලධාරීන් (තාවකාලික), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලක නිලධාරීන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාලන සහකාර නිලධාරීන් සඳහා පැවැත්වෙන විභාගයන් ;

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව (කොළඹ වරාය කොමිෂම), විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත්වෙන වාචික පරීක්ෂණයන් එකම දිනයකදී එකම ස්ථානයකදී පැවැත්වේ.

3. පහතින් දැක්වෙන අන්දමට පුල්ස්කැප් පිටු බාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස් තුමන් යටතේ ය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත 1960 සැප්තැම්බර් 17 වැනි දිනට පෙර රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ආර්. ආර්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1960 අගෝස්තු 20 වැනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

### අයදුම් පත්‍රය

#### ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

සිවිල් සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන් හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය—ජනවාරි/අප්‍රේල්/ජූලි/ඔක්තෝබර්, 19—

(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමන් වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපෑලෙන් යවනු සඳහා ය.

ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

(1) පෙලපත් නම:————.

අනෙක් නම්:————.

(2) තනතුරු:————.

දෙපාර්තමේන්තුව:————.

(3) ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය):————.

(4) ඔබ යෙදී සිටින්නේ සිවිල් සේවයේ ද, විදේශ සේවයේ ද, එසේ නැත්නම් ඔබ අයිති කවර දෙපාර්තමේන්තුවකට ද? නො එසේ නම් ඔබ වාණිජ අයදුම්කරුවෙක් ද?:————.

(5) විභාග දෙකකට පෙනී සිටීමට ඔබට සිදුවී ඇත්නම් මේ ඇතුළත් වන්නේ පළමු වැන්නටද දෙවැන්නටද?:————.

(6) ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න. (ඔබ ගන්නේ ව්‍යවහාර භාෂාවද ලේඛන භාෂාවද නැතහොත් ඒ දෙකමද?) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගන්නා සිවිල් නිලධාරීන් තමන් පෙනී සිටින්නේ පහළ පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද නැත්නම් උසස් පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද යන්න සඳහන් කළ යුතුය:————.

1. ————.
2. ————.
3. ————.
4. ————.
5. ————.
6. ————.

(7) අයදුම්කරුගේ අත්සන සහ දිනය:————.

විභාග කොමසාරිස්තුමන් වෙත ය.

ඉහතින් දැක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි.

ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපේක්ෂකයා විභාගය සඳහා සුදුස්සකු බව, මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අත්සන සහ තනතුර.

දිනය:————.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන උපකරණ වලින් ගොනු කවර ඇඳිය සාද සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 20 වැනි අඟහරුවාද පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 19 වැනි සඳුද දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

යූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹදීය.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඩී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් 26 වැනි දින පෙරවරු 11 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 ඔක්තෝබර් 27 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින් ඒ සඳහා පැමිණ සිටීමට කැමති, ටෙන්ඩර්කරුවන්ට එසේ කළ හැක:—

| ද්‍රව්‍ය | | ටෙන්ඩර් අංකය |
|---|---|---|
| (1) ලෝහ කපන, ලියවන පට්ටලයක් ආදි කරුණු 5ක් | ... | ඩී.එල්.එෆ්.—56 |
| (2) යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීමේ ආයුධ (කරුණු 9ක්) | ... | ඩී.එල්.එෆ්.—58 |
| (3) ගල් විදින කටු ආදී කරුණු 7ක් | | ඩී.එල්.එෆ්.—59 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන්

වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

කොළඹ 2,
1960 අගෝස්තු 22 වෙනි දින.

---

## අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම— වවුනියා ගුදම.

1961 ජනවාරි 1 වැනි දා පටන් එක් අවුරුදු කාලසීමාවක් තුල, වවුනියාවේ පිහිටි සුරා ගුදම සහ එහි දුම්රිය බඩුගබඩාවත් අතර, අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම සඳහා, සීල් තබන ලද ටැන්ඩර් පත්, උතුරු කොට්ඨාශය භාර යාපනයේ සහකාර සුරාබද්ද කොමසාරිස් විසින්, වර්ෂ 1960 සැප්තැම්බර් මස 27 වැනි අඟහරුවාද දවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. මේ සඳහා රුපියල් 10ක් තැන්පත් කිරීමෙන් ලබාගත් කච්චේරි කුවිතාන්සියක් එකී සහකාර සුරාබද්ද කොමසාරිස් වෙත ඉදිරිපත් කලවිට ලබාගත හැකි පෝර්මවල ටැන්ඩර් ඉදිරිපත් කළයුතුය.

3. මෙම කාරණයට අදාල වැඩි විස්තර එම සහකාර සුරාබද්ද කොමසාරිස් තැන ගෙන් ලබාගත හැක.

ටී. බී. වඩුගොඩපිටිය,
සුරාබද්ද කොමසාරිස්.

1960 අගෝස්තු 19 වැනි දින,
කොළඹ 6, සැවෝයි ගොඩනැගිල්ලේ,
සුරාබද්ද කොමසාරිස් තැනගේ කාර්යාලයේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8 කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාග ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර මස 20 වැනි දින පෙරවරු 11.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ඒ විෂයන් ඉදිරියෙන් සඳහන් මුදල් ප්‍රමාණයන් අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන ගෙන් සල් තබන ලද ටැන්ඩර පත්‍ර භාරගනු ලැබේ :—

| වැඩ පිළිබඳ විස්තරය | ලියාපදිංචි ප්‍රමාණය |
|---|---|
| (1) හෙට්ටිගේ ඔය අමුණ සෑදීම ... | රු. 9,000 |
| (2) පුස්වෙල ඔය හරහා අමුණක් සෑදීම | රු. 23,500 |
| (3) 1960/61 මුදල් වර්ෂය තුළදී ගබඩා බඩු එහා මෙහා ගෙන යෑම— කොළඹ උප කොටස ... ... | රු. 25,000 |

වැඩි විස්තර හා සැලැස්ම බලාගැනීම කරගත හැක්කේ පහත සඳහන් ස්ථානයෙනි. අනු පිටපතක් සමග එවිය යුතු ටැන්ඩර් පත්‍ර 60.9.17 වන දින සවස 1 දක්වා එම ස්ථානයෙන්ම ලබාගත හැකිය. ඕනෑම ටැන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ ඒවා සම්පූර්ණයෙන් අවලංගු කිරීමේ හෝ බලය රජය සතුය.

ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී ඒ සඳහා රුපියල් 25 (එක් වැඩයකට) තැන්පත් මුදලක් ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් පහත සඳහන් ස්ථානයෙහි තැන්පත් කළ යුතුය.

දැනට රජයේ කොන්ත්‍රාත් ලබාගෙන ඇති ඉල්ලුම් කරුවන් සතුටුදායක අන්දමින් ඒ වැඩ කෙරෙන බවට ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රා. ඇ. ලෝබෝ,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කොළඹ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
වේලුවන පාර,
කොළඹ 9, 16.8.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8, කෝට්ටේ පාරේ, බටහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ජාවත්තේ ප්‍රධාන වාරිමාර්ග කාර්යාලය මායිමේ තාප්පයක් තැනීම සහ ගේට්ටුවක් සෑදීම සහ සවි කිරීම ආදිය සඳහා රු. 19,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් ගෙන් 1960 සැප්තැම්බර් මස 20 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලියා පදිංචි කළ තැපෑලෙනි. ලියුම් කවරයේ වම් කෙළවරෙහි "ප්‍රධාන වාරිමාර්ග කාර්යාලය මායිමේ තාප්පයක් තැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කොළඹ. 8. කෝට්ටේ පාරේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

කොළඹ 5, ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් 1960 සැප්තැම්බර් මස 16 වෙනි දින පස්වරු 4.30 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනුපිටපතක් ද සමගය. වැඩි විස්තර හා සැලැස්ම එහිදී බලාගත හැකිය.

ඕනෑම කච්චේරියක හෝ පහත සඳහන් කාර්යාලයයේ හෝ රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සුදුසුකම් ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනටමත් රජයේ කොන්ත්‍රාත් වැඩ ලබා තිබෙන අය එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට වැඩය භාර නිලධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතුයි.

වී. කුමාරස්වාමී,
ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයය,
ජාවත්ත පාර, කොළඹ 5,
1960 අගෝස්තු මස 20 වෙනි දින දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 21 වෙනි බදාදා පෙරවරු 10 දක්වා මහනුවර උප කොට්ඨාශයේ 1960/61 වර්ෂය තුළ බඩු ඇදීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටැන්ඩර් භාරගනු ලැබේ. පිටපත් දෙකකින් යුක්තවූ ටැන්ඩර් පත්‍රිකා මහනුවර වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගෙන ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. එම නිලධාරිතැනගෙන් මේ වැඩය සම්බන්ධව සම්පූර්ණ විස්තර දැනගත හැක.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාර අරන් කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගන යන බවද ඒ ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සහතික ලබාගෙන ඉදිරිපත් කළ යුතුයි.

මහනුවර වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියේ මේ වැඩය සඳහා රුපියල් 25 මුදලක් තැන්පත් කොට ලබාගත් රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. එම කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 25.8.60 සිට 19.9.60 දින තෙක් රාජකාරියට නියමිත දින සහ වේලාවලදී මහනුවර වාරිමාර්ග කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

යටත් පිරිසෙයින් එක් ලොරියක් වත් තිබෙන කොන්ත්‍රාත් කරුවනට පමණක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට ප්‍රථම එම ලොරියේ හෝ ලොරිවල අයිතිවාසිකම් පෙන්නුම් කරන සහතිකය හෝ සහතික වාරිමාර්ග ඉංජිනේරුතැනට ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. ටී. කන්දසියා,
වාරිමාර්ග ඉංජිනේරු, මහනුවර උ. කො.

60. 8. 5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

හසලක උප කොට්ඨාශයට අයිති බඩු බාහිරාදිය මධ්‍යම පළාත ඇතුලත ගෙනයෑම සඳහා මහනුවර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 සැප්තැම්බර් මස 21 වෙනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. මේ සඳහා රුපියල් දහදහසකට (රු. 10,000) හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට ඉල්ලුම් කල හැක.

2. ටෙන්ඩර් හසලක උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමා වෙතින් ලබාගත් පෝර්මවල පිටපත් දෙක බැගින් විය යුතුය. වෙනත් විස්තර දැනගැනීම් මෙම කාර්යාලයේදී කළ හැක.

3. ටෙන්ඩර් පෝර්ම 1960 අගෝස්තු මස 22 වෙනි සඳුදා සිට 1960 සැප්තැම්බර් මස 19 වෙනිදා දක්වා සුදුසුකම් ඔප්පුකර මහනුවර කච්චේරියේ හෝ හසලක වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ

කාර්යාලයේ තැන්පත් කර රුපියල් විසිපහකට (රු. 25) ලැබූ රිසිට් පතක් ඉදිරිපත් කල අයට නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර්කරුවන් දැනට රජයේ කොන්ත්‍රාත් කරන්නේ නම් එම වැඩ සතුටුදායක ලෙසට කරන බවට ඒ වැඩ භාර නිලධාරීන් ගෙන් ලැබූ සහතිකයක් ටෙන්ඩර්පත්‍ර ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර 1960 සැප්තැම්බර් මස 21 වෙනි දින පෙරවරු දහයයි තිහට මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
හසලක උප කොට්ඨාශය.

15.8.60

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### තිස්ස වාරිමාර්ග උප කොට්ඨාශය තුළ බඩු එහාමෙහා ගෙනයාම

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස වාරිමාර්ග උප කොට්ඨාශය තුල බඩු එහා මෙහා ගෙනයාම සඳහා ටෙන්ඩර් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 5,000 කට හෝ ඊට වඩා වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 සැප්තැම්බර් මාසයේ 13 වන දින පෙරවරු 10 වන තෙක් තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාරගනු ලැබේ.

තිස්සමහාරාමයේ වාරිමාර්ග නිලධාරි තැනගෙන් අවශ්‍ය පෝර්ම ලබා පිටපත් දෙක බැගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

1960 සැප්තැම්බර් මස 5 වෙනි දින සිට 9 වෙනි දින දක්වා කාර්යාල වේලාවන්හිදී මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට රුපියල් 25 ක් තැන්පත් කර කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හෝ වාරිමාර්ග අධ්‍යක්ෂ තුමාගේ නමට ගත් මුදල් ඇනවුම් පතක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

අයි. ද ලීමා,
උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැන.

වාරිමාර්ග කාර්යාලයය,
තිස්සමහාරාමය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරුතුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි රිදියගම කාමර 5 හෙ කම්කරු නිවාසයට කුස්සි 5 ක් සෑදීම සඳහා 1960 සැප්තැම්බර් මස 13 වන අඟහරුවාදා පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් ලබාගත් පෝර්මවලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් විමසන්න, නැතහොත් 60.8.18 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 6,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට 60.8.26 දින සිට 60.9.9 දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

වෝ. ල. ද. සී. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉන්ජිනේරුතුමා,
හම්බන්තොට.

1960 අගෝස්තු 18 වෙනි දින,
වාරිමාර්ග කාර්යාලය,
හම්බන්තොට.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි වලවේ වම් ඉවුර ව්‍යාපාරයේ "ඒබ්‍රහම් පාර" අලුත් වැඩියා කිරීම සඳහා 1960 සැප්තැම්බර් මස 13 වන අඟහරුවාදා පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් ලබාගත් පෝර්මවලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් විමසන්න, නැතහොත් 1960. 8. 18 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 13,500 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට 1960.8.26 දින සිට 1960.9.9 දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

වෝ. ල. ද. සී. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉන්ජිනේරුතුමා,
හම්බන්තොට.

වාරිමාර්ග කායසීලය,
හම්බන්තොට,
18. 8. 60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමලය කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර් 13 වෙනි අඟහරුවාදා පෙරවරු 10 තෙක් පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

වැඩ පිළිබඳ විස්තරය :—

(1) කන්තලේ ව්‍යාපාරයේ පේරාආරු කොටසේ කුඹුරු කැබලි යන්ත්‍ර මාර්ගයෙන් සමතලා කිරීම සඳහා ;

(2) කන්තලේ ව්‍යාපාරයේ වෙන්ඩ්රසන් ආරු කොටසේ කුඹුර කැබලි යන්ත්‍ර මාර්ගයෙන් සමතලා කිරීම සඳහා ;

(3) කන්තලේ ව්‍යාපාරයේ මුල්ලිපොතාන කොටසේ කුඹුරු කැබලි යන්ත්‍ර මාර්ගයෙන් සමතලා කිරීම සඳහා.

මේ පිළිබඳ වැඩි විස්තර හා ටෙන්ඩර් පෝර්ම පත්‍ර කන්තලේ ව්‍යාපාරය බාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් ද සමගය.

1960 සැප්තැම්බර් 1 වෙනි දින සිට 10 වෙනි දින දක්වා කායසීල වේලාවල් තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ තමන් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කිරීම සඳහා ලියාපදිංචි කරන ලද පොත ඉදිරිපත් කළ හැකි අයට පමණය. ඒ සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කායසීලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් තම පුද්ගලිකම් සමග ඉදිරිපත් කිරීම අවශ්‍යවේ.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද සඳහන් වන සහතික පත්‍ර එම නිලධාරිගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුයි.

කන්තලේ ව්‍යාපාරය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

1960 අගෝස්තු මස 16 වෙනි දින,
කන්තලේදිය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කන්තලේ ව්‍යාපාරයට අයත් ගල්මැටියා වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙළට සම්බන්ධ අඩි 3නේ හියුම් පයිප්ප සොරොව් කනුවක් බැඳීම සඳහා ත්‍රිකුණාමලය කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර් 13 වෙනි අඟහරුවාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර හා ටෙන්ඩර් පෝර්ම පත්‍ර කන්තලේ කන්තලේ ව්‍යාපාරය භාර වාරිමාර්ග ඉජිනේරු තැනගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් ද සමගය.

1960 සැප්තැම්බර් 1 වෙනි දින සිට 10 වෙනි දින දක්වා කායසීල වේලාවල් තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන්නේ තමන් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කිරීම සඳහා, ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කායසීලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණය. රු. 20,000 සහ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද සඳහන් වන සහතිකපත්‍ර එම නිලධාරීගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුයි.

කන්තලේ ව්‍යාපාරය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

1960 අගෝස්තු මස 16 වෙනි දින,
කන්තලේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඊසාන කොට්ඨාශය භාර, වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960-61 මුදල් වර්ෂය තුළ මින්නේරිය උප කොට්ඨාශයේ බඩු ඇදීම සඳහා 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 9.30ට දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000කට හෝ ඊට වැඩිවූ මුදලකට ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එවිය යුතුය. මේ සඳහා ෆෝරම සහ වැඩි විස්තර මින්නේරිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

3. මින්නේරිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු 27 දින සිට සැප්තැම්බර් 10 දින තෙක් ටැන්ඩර් පත්‍ර දෙනු ලැබේ. මේ දක්වා ඕනෑම කච්චේරියක හෝ මින්නේරිය වාරිමාර්ග කායඝීලයේ රු. 25ක ඇප මුදලක් තබා ඒ වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ඕනෑම ටැන්ඩර් පත්‍රයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම ඊ. කො. ප්‍රා. වා. ඉ. තැනගේ කැමැත්ත පරිදි කිරීමට බලය පැවරී ඇත.

5. ටෙන්ඩර් පත්‍ර (මුල් පිටපත) ලියා පදිංචි තැපෑලෙන් ඊ. කො. ප්‍රා. වා. ඉ. වෙත යැවිය යුතුය. එය යවන ලියුම්කවරයේ ඉහළ වම් කෙළවර "මින්නේරිය උප කොට්ඨාශයේ බඩු ඇදීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

6. ටෙන්ඩර් පත්‍ර කැඳවන අවස්ථාවේදී ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ අයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ජී. එස්. එම්. හොක්මන්,
මින්නේරිය උප කොට්ඨාශ භාර
වාරිමාර්ග ඉංජිනේරු.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන දිශාව භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින්, පොළොන්නරුවේ නව නගරයේ නොම්මර 1 දරණ ඕවර්සියර් නිවාසය තැනීම සඳහා වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් මස 21 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ වාරිමාර්ග කායඝීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරණ ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිබඳ විස්තර පොළොන්නරුවේ වාරිමාර්ග කායඝීලයෙන් ලබාගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති රුපියල් 25 ක් කච්චේරියේ හෝ මෙම කායඝීලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට වර්ෂ 1960 ක්වූ අගෝස්තු 29 වෙනි දින සිට වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් 19 වෙනිදා දක්වා ආකෘති පත්‍ර නිකුත් කරණු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒ වා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවසථාවේදී පෙනීසිටීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් මස 21 වැනි බදාදා පෙරවරු 9.30 ට ඊශාන දිසාව භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායඝීලයට පැමිණිය යුතුයි.

කේ. ඩී. පී. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු තැන, පොළොන්නරුව
උප කොට්ඨාශය.

පොළොන්නරුව,
1960. 8. 18,

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ස්ථානවලට පහත සඳහන් දෑ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960.9.9 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

1. මුරුන්කන් ගොවිපලේ 1960-61 මහ කන්නයේ කුඹුරු අක්කර 90ක් සකස් කිරීම.

(අ) වල් පැලෑටි සියල්ල විනාශ වන අයුරු 1960 සැප්තැම්බර් ඔක්තෝබර් මහ කන්නයේ පළමුවන වැස්සේදී "ටයින් කල්ටිවේටරයක" හෝ "ඩිස්ක් හැරෝ"වක ආධාරයෙන් සී සෑම (දෙවරක්) හා ඉන්පසු—

(ආ) වැපිරීමට යෝග්‍ය වන පරිදි 1960 ඔක්තෝබර්-නොවැම්බර් පළමු වාරිමාර්ග ජලය සැපයීමේදී නගුලෙන් හෝ "කල්ටිවේටරය"යක් මගින් සම්පූර්ණයෙන් මඩකර සමතලා කිරීම. මඩකර සමතලා කරණ විට සියලුම වල් පැලෑටි යටකර වැපිරීමට සූදානම් කළ යුතුයි. දිනකට අඩුවශයෙන් අක්කර 5ක් මඩකර සමතලා කර වැපිරීමට සූදානම් කළ යුතුයි. සම්පූර්ණ වැඩය ගොවිපල කළමනාකාර තැනගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ අවශ්‍යතාවයන්ට අනුව ඔහු නියම කරණ දියන්ගිදී සම්පූර්ණ කළ යුතුයි. සඳහන් කරණ මිල ගණන් අක්කරයකට විය යුතුයි. තෝරාගනු ලබන කොන්ත්‍රාත්කරු සම්පූර්ණ වැඩය හෝ කොටසක් භාර ගැනීමට සූදානම් විය යුතුය.

2. මන්නාරම කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා, සිල්තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "මුරුන්කන් ගොවිපලේ කුඹුරු අක්කර 90ක් සකස් කිරීම" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්ටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් ලිපිකරුට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "මුරුන්කන් ගොවිපලෙහි කුඹුරු අක්කර 90ක් සකස් කිරීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියා පදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුනු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩ් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබූවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ

15. වැඩ පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම උප කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අගෝස්තු මස 26 දා,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පාවිච්චි කළ ෆෝර්ඩ්සන් ට්‍රැක්ටර් 100ක් මිළදී ගැනීම

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 16 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් පාවිච්චි කළ ෆෝර්ඩ්සන් ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ෆෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගන්නොරුවේ යාන්ත්‍රික වැඩපොළේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 200ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබාගත හැක. වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අගෝස්තු මස 18 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ ඹපනායක පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවට 1960 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. රත්නපුර කච්චේරියට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත්නාලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලකතුමාට ඉදිරිපත් කර 1960 සැප්තැම්බර් මස 15 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර රත්නපුරයේ නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමාගෙන් හෝ ලබාගත හැකිය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960. 8. 26,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රු. 10,000 කට අඩු නොවන කොන්ත්‍රාත් වැඩ කර තිබෙන ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ මුත්තූර්හි තිබෙන නියමිත මිල යෝජනා ක්‍රම ගබඩා භූමිභාගයේ වී පෙඟවීමට ගඩොල් වලින් ටැන්කි කුට්ටම් දෙකක්, උඳුන් සහ වී වේලීමට ගඩොල් අල්ලා සකස් කරන්ලද බිම් සෑදීම පිණිස කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ හෝටන් පෙදෙසෙහි අංක 60 දරණ ස්ථානයේ තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට හෝ ඕනෑම කච්චේරියකට රු. 500 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත්කර 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාදා දවල් 12 වනතුරු නිකුත් කරනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගෙන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගත හැක්කේ කොළඹ, ඩීන්ස් පාරේ අංක 336, දරණ ස්ථානයේ තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙනි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ත්‍රිකුණාමලේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තුමාගේ කාර්යාලයෙන් හෝ ලබාගත හැකිය.

කේ. සිත්තම්බලම්.
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960.8.26
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහගල්වැව, රත්නපුර දිස්ත්‍රික්කයේ චන්ද්‍රිකාවැව යන ව්‍යාපාරයනට 1960-61 මුදල් වර්ෂයේ මුල් භාගය සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහගල්වැව, රත්නපුර දිස්ත්‍රික්කයේ චන්ද්‍රිකාවැව යන ව්‍යාපාරයනට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා මිළ ගණන් සඳහන් ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 15 වෙනි දින දහවල් 12 දක්වා ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් භාරගනු ලැබේ.

(1) පොල් අතු—දිග අඩි 7 ටත් පළල අඟල් 12 ටත් අඩු නොවිය යුතුයි. (1,000 ගණනින්)

(2) හුණු අළු—බුසල් ගණනින් (බුසල් එකක් රාත්තල් 44 කට අඩු නොවිය යුතුයි).

(3) තම්බාපු හුණු—බුසල් ගණනින්.

(4) කළුගල් කැබෙලි—අඟල් 6"×9"—කියුබ් ගණනින්.

(5) තලාපු කළුගල්—අඟල් 3/4—කියුබ් ගණනින්.

(6) තලාපු කළුගල්—අඟල් 1—කියුබ් ගණනින්.

(7) තලාපු කළුගල්—අඟල් 2—කියුබ් ගණනින්.

(8) පිළිස්සූ ගඩොල්—1,000 ගණනේ (අඟල් $8\frac{3}{4} \times 4\frac{1}{4} \times 2\frac{3}{4}$ ප්‍රමාණ විය යුතුයි). පෝරණුව වැඩපලට සැතපුම් පහකට වඩා ඈත් නොවිය යුතුයි.

2. මිළ ගණන් පහත දැක්වෙන් අයුරු වෙන වෙනම සඳහන් කළ යුතුයි.

(අ) ලොරි ගමන් කළහැකි ස්ථානයක පිහිටා තිබේ නම් වත්ත, පෝරණුව, ගල්වළ අසලදීම භාරදීම සඳහා මිළ. පිහිටා ඇති ස්ථානයට ව්‍යාපාරයේ සිට ඇති දුරත් සඳහන් කළ යුතුයි.

(ආ) ව්‍යාපාරයට ගෙනැවිත් භාරදීමට මිළ.

3. 1960 සැප්තැම්බර් 8 වන දින දහවල් 12 දක්වා ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබාගත හැකි ෆෝර්ම වල ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට අනු පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුයි. එක් එක් ව්‍යාපාරයකට එක් එක් ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රයකට රු. 50 බැගින් ඇප මුදල් ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායර්‍යාලයේ හෝ වෙන යම් කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

4. 1960 සැප්තැම්බර් මස 15 වෙනි දින පස්වරු 2.30 ට ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ඉල්ලුම් කරුවන්ට තමන් කැමැති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ පෙනී සිටිය හැක.

5. මේ සඳහා වැඩි විස්තර ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගෙන් ලබාගත හැක.

ජී. දිසානායක,
ඉඩම් සංවර්ධන නිලධාරි—ඇඹිලිපිටිය.

1960 අගෝස්තු 8 වෙනි දින,
ඇඹිලිපිටියේ ඉඩම් සංවර්ධන කායර්‍යාලයේ දීය.

## රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව

රාගම, සීදූව, ජාඇල, මීගමුව, බෝලවත්ත, නාත්තන්ඩිය, මාදම්පේ, හලාවත, ගම්පහ සහ වේයන්ගොඩ යන එක් එක් දුම්රිය ස්ථානවල සිට හැතැප්ම 25ක් දුර ප්‍රමාණයේ ඕනෑම තැනකට බඩු බාහිරාදිය ගෙනගොස් බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ මැක්ලම් පාරෙහි පිහිටා ඇති රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 සැප්තැම්බර් මස 14 වෙනි දින දවල් 12 තෙක් භාරගනු ලැබේ.

මේ සඳහා නියමිත ටෙන්ඩර් පත්‍ර සහ වැඩි විස්තර, මීගමුවේ කිඹුලාපිටියේ පාරේ පිහිටි රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබනුයේ රුපියල් 2ක ටෙන්ඩර් ගාස්තුවක් සහ රුපියල් 25ක ඇප මුදලක් කොළඹ මැක්ලම් පාරේ පිහිටි ගණකාධිකාරී තුමාගේ කාර්යාලයේ තැන්පත් කොට ඔහුගෙන් ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණි.

ඊ. සී. ප්‍රනාන්දු,
සාමාන්‍ය කළමණාකරු,
රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව.

---

## කම්කරු දෙපාර්තමේන්තුව

### වැඩට ගත නොහැකි මෝටර් වාහන 20 ක් මිළයට ගෙන ඉවත් කර ගෙන යෑම සඳහා

කොළඹ 5, කනත්ත පාර හන්දියේ විරක්ෂා සහන වැඩපොලේ ඇති, වැඩට ගත නොහැකි මෝටර් වාහන 20 ක් මිළයට ගෙන ඉවත් කර ගෙන යෑම සඳහා කොළඹ, කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 16 වන සිකුරාද පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 3, පහලවැව පාරේ පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගෙන් ලබා ගත හැකි පෝර්මවල ය. මේ පිළිබඳ සියලුම විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

3. 1960 සැප්තැම්බර් මස 16 වන සිකුරාද පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් කැමැත්තෙහි නම් ඔවුන්ට පැමිණ සිටීමට ද පුළුවන.

සී. බී. කුමාරසිංහ,
වැඩබලන කම්කරු කොමසාරිස්වරයා.

1960 අගෝස්තු මස 19 වෙනි දින,
කොළඹ කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 15 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා, පාවිච්චිකළ මෙරට උළු 3,000ක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 සැප්තැම්බර් මස 15 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ බවට එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. රු. 25ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොල වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කෙහොබන් වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 අගෝස්තු මස 17 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන්
කාර්යාලයේ දීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පහත සඳහන් වන කටයුතු කරදීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර, ඒ කටයුතු කෙළින් දක්වා ඇති දිනවල පෙ. ව. 10 වන තෙක්, කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් බාරගනු ලැබේ :—

1. බස් මගී ටිකැට් පත්‍ර මුද්‍රණය කිරීම — 1960.9.21
2. "ලංගමට" එවන නැව් බඩු ගොනැත් දීම — 1960.9.21

ටෙන්ඩර්පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන්, ටෙන්ඩර පත්‍ර බාරගැනීම නවත්වන දිනයට කලින් දා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා දෙන්නේ, කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් රු. 50 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඊට ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960.8.26.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පණිවුඩ මාගී 150/200 යේ ඉබේ ක්‍රියා කරන පුද්ගලික ටැලිපෝන් හුවමාරු යන්ත්‍රයක් සපයා බොරලැස්ගමුවේ වේරහැර සවිකිරීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 ඔක්තෝබර් මස 26 වෙනි දා වන බදාදා පෙ.ව. 10 වන තෙක් බාරගනු ලැබේ. බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් වැඩි විස්තර අසාගත මැනවි.

ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන ටෙන්ඩර පෝරමවල ලියා එවන ටෙන්ඩර පත්‍ර බාරගනු ලැබේ. ටෙන්ඩර පෝරම දෙන්නේ ඉදිරිපත් කරන උපකරණ වෙනුවෙන් මේ රටේ ඒජන්සියක් ඇත්තාවූද මේ යන්ත්‍රයට කිට්ටු ප්‍රමාණයක ඉබේ ක්‍රියා කරන පුද්ගලික ටැලිපෝන් හුවමාරු යන්ත්‍රයක් ලංකාවේ සවිකොට ඇති බවට සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ හැකිවූද වෙළඳ සමාගම්වලට පමණකි. අමතර කොටස් සැපයීමටද යන්ත්‍රය සවිකොට අවුරුද්දක් යන තුරු එම යන්ත්‍රය නඩත්තු කිරීමටද එම යන්ත්‍රය නඩත්තු කිරීම සඳහා අමතර මුදලක් අය නොකර (මෙකී කාලය තුළදී) "ලංගමයට" කාර්මිකයකු පුහුණුකර දීමටද ඔවුන් ඇපවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන් විසින් තම සහතික පත්‍ර ආදිය පරීක්ෂාව හා අනුමත කිරීම පිණිස බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඒ මහතා ඒවා පිළිගත් පසු ඔවුන් විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රු. 200 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි. ඒ මුදල තැන්පත්කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා විසින්, අවශ්‍ය ටෙන්ඩර ලිපි 1960 ඔක්තෝබර් මස 22 වෙනි දා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960 අගෝස්තු 18 වෙනි දිනදීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සතුන්, තණ, දර සැපයීම

1960 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1961 සැප්තැම්බර් 30 දයින් අවසන් වන වර්ෂය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර, සතුන් සහ තණකොළ ආහාර සැපයීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හො ලාංකික ආයතනවලින් කොළඹ, ගාලු මුවදෙර මහා ලේකම් කාර්යාලය ඉඳිරිපිට "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයනු ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ සමඟ ඇති උපලෙඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකු ගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමඟ ඇති උපලෙඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට කොළඹ කච්චේරියෙහි හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම මෙම කායර්‍යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල් බැංකුව බාර ගනු නො ලැබේ.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි, ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝරම ලබාගත යුතුයි. තැපැලෙන් ටෙන්ඩර පෝර්ම ඉල්ලුම් කරන අය, මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කායර්‍යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නො හැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම කොළඹ ගාලු මුවදෙර මහාලේකම් කායර්‍යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තැ. පෙ. 584, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත්තු පිළිබඳ ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාර දී හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දින පෙරවරු 10ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක් ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. එක් ආයතනයක් සඳහා සැපයිය යුතු ආහාර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිලධාරිතුමාගෙන් හෝ මෙම කායර්‍යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කායර්‍යාලයට අයදුම් පතක් එවීමෙන් දනගත හැකිය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

ගාලුමුවදෙර පිහිටි
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය,
තැ. පෙ. 584, මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ, 22.8.60.

උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| | රු. | රු. | |
| දර සැපයීම— | | | |
| හැඳල ලාදුරු රෝහල ... | 100 ... | 600 | |
| අංගොඩ මානසිකා රෝහල... | 100 ... | 200 | |
| අයිතිකම් නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම— | | | 16.9.60 පෙ.ව. 10ට |
| අනුරාධපුර රෝහල ... | 100 ... | 150 | |
| ත්‍රිකුණාමල රෝහල ... | 100 ... | 150 | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 සැප්තැම්බර් 27 වෙනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

1. ගිනිගත්හේන රෝහලට ජල සම්පාදන ක්‍රමයක් තැනීම

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 සැප්තැම්බර් 16 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, රුපියල් 40,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5 වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කායර්‍යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
22. 8. 60.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා වෂී 1960 සැප්තැම්බර් 13 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

1. ගලේවෙල රෝහලෙහි මතුපිට කානුව තැනීම

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960.9.9 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 3,000 කට වඩා වටිනාකමැති කාණු තැනීමේ හෝ ඒ හා සමාන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5 වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලුම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලුම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පූරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
22.8.1960.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව — සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා වර්ෂ 1960.9.20 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) බණ්ඩාරවෙල රෝහලෙහි සෑඩ සුළඟින් වූ කැඩුම් බිඳුම් අළුත් වැඩියා කිරීම, ගරාජය තැනීම සහ නඩත්තු කිරීම

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 9.9 වැනි සිකුරාදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබෙන්නේ රුපියල් 40,000 කට වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර්පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පූරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම් කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
18.8.1960.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1960 සැප්තැම්බර් මස 16 වැනි කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කායඝාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ ;—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. එච්/රිටිගහයාය රජයේ විද්‍යාලය | ළිඳ |
| 2. එච්/දෙබරවැව මහා විද්‍යාලය ... | ජලය සැපයීම |
| 3. එච්/පන්නගමුව රජයේ විද්‍යාලය | ළිඳ |
| 4. එච්/සිරිනමලුව රජයේ විද්‍යාලය | ළිඳ |
| 5. ගා/බලපිටිය ගුරු විද්‍යාලය ... | කාණු තැනීම |
| 6 ගා/බලපිටිය ගුරු විද්‍යාලය ... | ගිනි උදුන |
| 7. ගා/නුගේතොට රජයේ විද්‍යාලය | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |

**සංලක්ෂ්‍යය.**—1. ගා = ගාලු දිස්ත්‍රික්කය.
මා = මාතර දිස්ත්‍රික්කය.
හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

**සංලක්ෂ්‍යය.**—2. අවශ්‍ය ලියාපදිංචි කිරීම.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව—රු. 5,000 ; ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රු. 10,000 ; අනුමත කළ සමිති සමාගම් රු. 10,000.

2. ඉහත දැක්වෙන දෙවන සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ කළ හැකි බවට සමූපකාර රෙජිස්ත්‍රාර් තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ සහතිකයක් ගාල්ලේ අධ්‍යාපන නිලධාරි තුමාට ඉදිරිපත් කළ හැකි විවිධ සේවා සමූපකාර සමිති වලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 15 වැනිදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගේ කායඝාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කායඝාලයක එම වැඩය සඳහා රුපියල් 100 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ගාල්ලේ අධ්‍යාපන නිලධාරිතුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය බාරගනු නොලැබේ.

රුපියල් 25,000 වැඩි වැඩ සඳහා අනුමත කළ සමිති සමාගම්වලට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඔවුන් කොන්ත්‍රාත්කරුවන් වශයෙන් මේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිනම් පමණකි.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවෙනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරිතුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කායඝාලය, ගාල්ල" යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් නො එවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කායඝාලයේ කායඝාලා සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුවන්ගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තිබිය යුතුයි.

5. 1960 සැප්තැම්බර් මස 16 වැනි කිවිදින පස්වරු 2.30ට ගාල්ලේ අධ්‍යාපන කායඝාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරිතැන විසින් ගාස්තු ප්‍රමාණයද, (රේට් ගණන්ද) ටෙන්ඩර් කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැන ගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

2. ටෙන්ඩර් අයදුම් පත්‍ර දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත හැක. ටෙන්ඩර් ඉදිරිපත් කරන විට එහි අනු පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් ආහාර ද්‍රව්‍යයන් සැපයීමට වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර ටෙන්ඩර් පත්‍රිකා සීල් කරන ලද කවරයන්හි බහා "සත්ව ආහාර සැපයීමට ටෙන්ඩරය", "එළවළු සහ පළතුරු සැපයීමට ටෙන්ඩරය" ආදී වශයෙන් කවරයන්හි මුදුන් වම් කෙළවරයේ සඳහන් කළ යුතුයි. ලිපිනය : සභාපති තුමා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, ප්‍රවාහණ සහ ප්‍රසිඩ වැඩ අමාත්‍යාංශය, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්, කොළඹ 1, යනුවෙන් සඳහන් විය යුතුය. ටෙන්ඩර් පත්‍රයන්හි යම් වැරදි නිදොස් කිරීමක් හෝ වෙනස් කිරීමක් ඇති කළහොත් එය ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුයි.

3. ටෙන්ඩර් ෆෝර්මයක් ලබාගැනීමට ප්‍රථම තැන්පත් මුදලක් වශයෙන් රුපියල් පණහක් (රු. 50ක්) කොළඹ කච්චේරියෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් පුද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකුගේ මාර්ගයෙන් සීල් කරන ලද ටෙන්ඩර් කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි, ප්‍රවාහන හා ප්‍රසිද්ධ වැඩ අමාත්‍යාංශයෙහි ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා වෙත හෝ එතුමා වෙනුවෙන් පෙනී සිටින නිලධාරියෙකුට භාර දී කුවිතාන්සියක් ලබාගත යුතුය.

5. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියල්ලම වුවත් ප්‍රතික්ෂෙප කිරීමට රජයට සම්පූර්ණ බලය තිබේ. ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් කරුවන්ට ප්‍රශ්න කිරීමට බලයක් නොමැත. මෙම දැන්වීමෙහි සඳහන් කොන්දේසිවලට එකඟ නොවන කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ.

6. 1960 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි, ප්‍රවාහන හා ප්‍රසිද්ධ වැඩ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට මේ ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී පැමිණ සිටීමට අවසර ඇත.

7. ටෙන්ඩර් පත්‍රයක් පිළිගත් බව ලියමනකින් දැන්වීමෙන් පසු දහ දිනක් ඇතුළත දී ගිවිසුම් පත්‍රයට හා ඔප්පුවට බැඳීමට හෝ නියම කරන ලද ඇප මුදල තැන්පත් කිරීමට නොහැකි වන ටෙන්ඩර් කරුගේ තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද ඉල්ලීම් සලකා බැලීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති තුනක් කල් දිය යුතුය. ටෙන්ඩර් කොන්දේසි කඩකළහොත් රජයට වන අලාභය ටෙන්ඩර් කරුවන් ගෙන් අයකර ගන්නා අතර එවැනි අයගේ නම් කොන්දේසි කඩ කරන රජයේ ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

8. මේ පිළිබඳ වැඩි විස්තර සත්වෝද්‍යාන කාර්යාලයෙන් ලබාගත හැක.

ඔබ්රි ඇන්. වයිමන්,
අධ්‍යක්ෂ.

1960 අගෝස්තු 21 වැනි දින,
දෙහිවල සත්වෝද්‍යානයයේ දීය.

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### මෝටර් වාහන තුනක් සැපයීම

විශේෂ විස්තරවලට අනුකූලව මෝටර් වාහන තුනක් සැපයීම සඳහා 1960 සැප්තැම්බර් මස පළමු වෙනි දින පෙරවරු 9.30 වන තෙක්, කොළඹ, ප්‍රධාන තැපැල් කාර්යාලයේ, පෝස්ට්මාස්ටර් ජනරාල් තැන විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ, ටැලිග්‍රාප් කැෂියර් වෙත මුදලින් රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1960 අගෝස්තු මස 31 වැනි දින පස්වරු 4 වන තෙක්, ප්‍රධාන විදුලි සන්දේශ ඉන්ජිනේරු තැනගෙන් ලබා ගතහැකි ෆෝර්මවල ලියා අනු පිටපතක්ද සමඟ ටැන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. කවරයේ පිට පැත්තේ "මෝටර් වාහන තුනක් සැපයීම සඳහා ටැන්ඩර්" යනු සඳහන් කර සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ, ප්‍රධාන තැපැල් කාර්යාලයේ පෝස්ට්මාස්ටර් ජනරාල් තැන වෙත රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතහොත්, එම කාර්යාලයේ ප්‍රධාන ලිපිකරුට භාරදිය යුතුය.

4. ඇප මුදල ටැන්ඩරයේ වටිනාකමින් සියයට 5කි. කොන්ත්‍රාත්තුවට බැඳෙන විට මුද්දර ආඥාපනත යටතේ ගිවිසුම් පත්‍රයට මුද්දර ගැසීමට තෝරාගත් ටැන්ඩර්කරු බැඳී සිටී.

5. 1960 සැප්තැම්බර් මස පළමුවෙනි දින පෙරවරු 10ට කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ, පෝස්ට්මාස්ටර් ජනරාල් කායාලයේදී ටැන්ඩර් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටැන්ඩර්කරුවනට එහි පැමිණ සිටිය හැකිය.

එච්. ඊ. සෙනවිරත්න,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

1960 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේදීය.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කිරිබත්ගොඩ නිවාස ක්‍රමයෙහි (පොල් හා වෙනත්) ගස් 272ක් කපා ඉන් ඉවත්කිරීම

කිරිබත්ගොඩ නිවාස ක්‍රමයෙහි (පොල් හා වෙනත්) ගස් 272ක් කපා ඉන් ඉවත් කිරීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 සැප්තැම්බර් මස 23 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 25ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 සැප්තැම්බර් මස 21 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.
1960 අගෝස්තු මස 17 වෙනි දින.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### මහනුවර, කටුගස්තොට, ගාලවත්ත 1 ඩබ්ලිව් වයීයේ ගෙවල් 43 ක් සහ ළිං 4 ක් තැනීම

1960.8.5 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960.7.29 දාතමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන්. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් තව දුරටත් දීර්ඝ කර ඇත.

1960 සැප්තැම්බර් මස 26 වෙනි සඳුදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544, කොළඹ 2.
1960 අගෝස්තු මස 19 වෙනි දින.

---

## කොළඹ කච්චේරිය

රජයේ ගැසට් පත්‍රයෙහි 1960.7.22 දින පලවූ නිට්ටඹුවේ මැටි කර්මාන්ත මධ්‍යස්ථානයේ පෝරණයක් නැවත සෑදීම පිළිබඳ ටෙන්ඩර් පත් බාරගැනීම 1960.8.31 වන දින දහවල් 2 දක්වා දීර්ඝ කරණ ලදී. 1960. 8. 29 වන දින දහවල් 2 දක්වා ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය. වැඩි විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

ඇස්. සිවගුරුනාදන්,
කොළඹ රජයේ ඒජන්ත තැන වෙනුවට.

ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත,
දිස්ත්‍රික් කාර්යාලය, තැපැල් පෙට්ටි අංක 1501,
කච්චේරිය, කොළඹ.

## බීමට ජලය සැපයීම

1960 ඔක්තෝබර් මස පළමුවෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බදගිරිය හා මහගල්වැව ගොවි ජනපදවලට බීමට ජලය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර ලොරි අයිතිකරුවන්ගෙන් 1960ක් වූ සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා උදේ 11.30 දක්වා හම්බන්තොට වැඩ බලන දිසාපති තැන විසින් භාරගනු ලැබේ. එදින එකී වේලාවෙන් පසු ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

2. ගොවිජනපද දෙකටම බීමට ජලය සැපයීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර වෙන් වෙන් වශයෙන් කවරවල බහා මුද්‍රා තබා එක් එක් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බදගිරි ගොවි ජනපදයට බීමට ජලය සැපයීමට ටෙන්ඩර්" යනුවෙන් හෝ "මහගල්වැව ගොවිජනපදයට බීමට ජලය සැපයීමට ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. වතුර සැපයීම සඳහා තනි හැතැප්මකට අය කරන මුදල පැහැදිලිව අකුරෙන් හා ඉලක්කමෙන් ටෙන්ඩර් පත්‍රවල ලිවිය යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් පෝර්මය වෙනුවෙන් රු. 10ක මුදලක් හම්බන්තොට කච්චේරියේ හෝ වෙන කච්චේරියක තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීම 1960 සැප්තැම්බර් මස 10 වෙනි සෙනසුරාදා දවල් 12 දක්වා පමණකි.

4. ටෙන්ඩර් අනුව බීමට ජලය සැපයීමට තෝරා ගන්නා ටෙන්ඩර් කරු විසින් දිසාපතිතැනගේ නියමයන් අනුව ජලය සැපයීම කළ යුතුය. දිනපතාම ජලය සැපයීමට උවමනා වේදැයි සපිර වශයෙන් කීමට නො හැකිය. එමනිසා ජලය සැපයීමට උවමනා දින ගැන ඒ ඒ අවසථාවලදී දන්වනවා ඇත.

5. ජලය සැපයීමට තෝරා ගන්නා ටෙන්ඩර්කරු විසින් එක් ගමනකට අඩු ගණනේ වතුර ගැලුම් 800ක් ගෙන යා යුතුය. දිසාපති තැනගේ නියමයන් අනුව සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා රු. 500ක ඇප මුදලක් එක් එක් ජනපදය වෙනුවෙන් තැන්පත් කොට පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුවේ. එසේ සතුටුදායක ලෙස බීමට ජලය සැපයීමට තෝරාගත් ටෙන්ඩර්කරුට නොහැකි වුවහොත් ඇප මුදල රාජසන්තක කරනවා ඇත.

6. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිරිසිදු ගැල්වනයිස් ටැන්කිවල හෝ බව්සරයක වතුර පුරවාගෙන යා යුතුවේ. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් මේවා සපයා ගත යුතුවේ. අම්බලන්තොට පිහිටි වතුර සැපයීමේ මධ්‍යසථානයෙන් හෝ වෙන යම්කිසි සථානයකින් දිසාපතිතැනගේ නියමයන් අනුව වතුර ගෙන යායුතු වේ.

7. කිසිදු කරුණක් නොපෙන්වා ටෙන්ඩර් පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපතිතැන සතුවේ.

පී. සිවඥනම්,
වැඩබලන දිසාපති, හම්බන්තොට.

දිසාපති කාර්යාලය,
හම්බන්තොට,
1960.8.15.

---

මගේ අංකය : අයි/පීකේ ඇස්/522/2.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුළු වාරිකර්ම වැඩ

පහත දක්වන වාරිකර්ම වැඩ සඳහා මෙම කච්චේරියෙන් ලබාගන්නා ලද ආකෘතිපත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1960 සැප්තැම්බර් මස 3 වැනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ :—

1. කුඩාවැව (උතුරු පිටිගල් කෝරළේ)
2. මැදගොඩ වැව
3. උන්ඩියාකුලම
4. එරුනු වැව
5. පලුගහ වැව
6. ගෙදර වැව
7. මැල්ලව ඉහල බැම්ම
8. මැල්ලව පහල බැම්ම
9. තුලාවල බැම්ම
10. මොරුක්කුලිය බැම්ම

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 සැප්තැම්බර් මස 2 වැනි දින පසවරු 3 වන තුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබාගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 සැප්තැම්බර් මස 3 වැනි දින පෙ. ව. 10 ට පටන්ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම් කරුවනටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් හෝ විමසීමෙන් මගෙන් ලබාගත හැක.

වී. කේ. රාජරත්නම්,
පුත්තලමේ දිසාපති වෙනුවට.

1960 අගෝස්තු මස 19 දින,
පුත්තලම් කච්චේරියේදීය.

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අනුරාධපුර දිස්ත්‍රිකක්යේ දිසාපතිතුමා විසින් සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

1. මිහින්තලේ වැව තුලාන 23 ... වාන ප්‍රතිසංස්කරණය කිරීම.
2. කඳුබිඳුවැව තුලාන 23 ... ප්‍රතිසංස්කරණය කිරීම.

රුපියල් 25ක මුදලක් මෙම කච්චේරියේ තැන්පත් කිරීමෙන් ලබා ගන්නා ලද රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් මෙම කච්චේරියේ වාරිමාර්ග අංශයෙන් 1960 සැප්තැම්බර් මස 2 වෙනි දින පස්වරු 3 දක්වා නියමිත ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පුළුවන.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මෙම කච්චේරියේ වාරිමාර්ග අංශයෙන් ලබා ගැනීමට හැකිවේ.

නිශ්ශංක පරාක්‍රම විජයරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

1960 අගෝස්තු මස 18 වෙනි දින,
අනුරාධපුර නව ලේකම් කායඹාලයේදීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කරෙයි නගරීහි නාවික කඳවුරට අයත් එළාර නම් සථානයේ විවාහකයන් සඳහා "2 ඒ" ශ්‍රේණියේ නිවාස දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහන හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනය ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 2 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 60,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක්: "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ජී. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය.
1960. 8. 22.

වැලිසර ගොවිපලේ ගව ගාල් අටක සහ ඌරු කොටුවක වහලවල් සම්පූර්ණයෙන් අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ උතුරු ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7, ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 2 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක්: "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය.
1960. 8. 22.

---

කරෙයි නගාර් නාවික කඳවුරේ එළාර නම් ස්ථානයේ ලොකු රථ වාහන සඳහා ගැරේජ් පහක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනය ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 2 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 12,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක්: "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය.
1960. 8. 22.

---

රක්වාන තානායමෙහි කසල කාණු තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

පැල්මඩුල්ල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහු ගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 2 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ කසළ කාණු තැනීමේ වැඩ සඳහා රුපියල් 6,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක්: "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය.
1960. 8. 22.

---

# බඩු බාහිරාදිය විකිණීම

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පැල්වෙහෙර ගොවිපලේ සේවයට අයෝග්‍ය අංක සී. වී. 4798 දරණ මෝටර් වෑන් රථය විකිණීම

දඹුල්ලේ පැල්වැහැර රජයේ ගොවිපලේ දී 1960 සැප්තැම්බර මස 17 වැනි දින පෙරවරු 10ට අංක සී. වී. 4798 දරණ ඉන්ටර් නැෂනල් වෑන් රථය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වාහනය ගැනුම් කරු විසින් සම්පූර්ණ වටිනාකම වහාම තැන්පත් කිරීමට සහ දින තුනක් ඇතුළත එය ගොවිපලින් පිටකර ගැනීමට සූදානමින් සිටිය යුතුයි.

ඉහත සඳහන් ස්ථානයේ දී සතියේ දිනවලදී පෙරවරු 10 සිට පස්වරු 4.30 දක්වා කළමනාකාරතැන සමඟ සාකච්ඡාකොට වාහනය පරීක්ෂා කළ හැක.

ඒ. වී. රිචර්ඩ්ස්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ පේරාදෙණිය.

1960. 8. 15 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම කාර්යාලයේ දීය.

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

පරණ පුටු, මේස, සිනු ඔර්ලෝසු, අල්මාරි ආදී වෙනත් කාර්යාලීය උපකරණ හා ලී භාණ්ඩ රාශියක් 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා පෙරවරු 10 ට කොළඹ 2, 330, යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, 330, යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඞී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 අගෝස්තු 22 වෙනි දින,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

කොලොන්නාව, වැල්ලම්පිටියේ විදුලි ගබඩා අධිකාරි බාරයේ තිබෙන පාවිච්චි කළ නොහැකි බඩු කොලොන්නාව, වැල්ලම්පිටියේ විදුලිය ගබඩාවේ, විදුලි ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර් මස 2 වැනි දින සවස 2.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පාවිච්චි කළ නොහැකි බඩු පරණ ටයර්, ටියුබ්, බැටරි, fපියුස් යනාදියෙන් සමන්විත වූ අතර, ඒවා එදින උදේ 9 සිට දවල් 12 දක්වා කොලොන්නාව, වැල්ලම්පිටියේ විදුලි ගබඩාවේදී බැලිය හැක.

2. වෙන්දේසියේදී වැඩිම ඉල්ලුම්කරුට පාවිච්චි කළ නොහැකි බඩු විකුණන අතර, එම අවසථාවේදී සම්පූර්ණ මුදල් ගෙවා එම සථානයෙන් බඩු ඉවත් කර ගත යුතුයි.

ඊ. සී. ප්‍රනාන්දු,
ප්‍රධාන කළමනාකරු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුව.

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 540,
කොළඹ 10,
26.8.60.

---

## වෙන්දේසියේ විකිණීමයි

ටයිප්රයිටර්, බයිසිකල්, මෝටර් රථ අමතර කොටස්, කායසිාලයීය බඩු හා සාමාන්‍ය වැඩ ගත නොහැකි හා අමතර බඩු, කොළඹ 15 මට්ටක්කුලියේ පර්ගියුසන් පාරේ අංක 346 දරණ සථානයේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවට අයත් ටෝබේ ගබඩාවේදී, 1960 සැප්තැම්බර් 2 වෙනි සිකුරාදා පෙරවරු 10ට වෙන්දේසියේ විකුණනු ලැබේ. කොළඹ 2 වොක්ස්හෝල් වීදියේ අංක 188 දරණ සථානයේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවෙන් බඩු ලැයිස්තු බලාගත හැක. 1960 සැප්තැම්බර් 1 වෙනි බ්‍රහස්පතින්ද පෙරවරු 10ටත් පස්වරු 4ටත් අතර ඉහත සඳහන් ගබඩාවේදී බඩු පරීක්ෂා කර බැලීමට පුළුවන. මිලට ගන්නා බඩුවලට වහාම සම්පූර්ණ මුදල ගෙවිය යුතු අතර, එදිනම ඒවා ඉවත් කර ගත යුතු ය.

වී. රාජතුරෙයි,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ
වැඩබලන කොමසාරිස්.

1960.8.15 වැනි දින,
කොළඹ 2.

---

## කැලෑ දෙපාර්තමේන්තුව

කැළණිවැලි ගුඩ්ස් යාඩ්හී ලී ගබඩාවේ තිබෙන බුරුත කොටන් 100 ක් 1960 වේ සැප්තැම්බර් මස 7 වෙනි බදාදා උදේ 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ, මැකලම් පාරේ කැළණිවැලි ලී ගබඩාව භාරකරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිව් පාර,
කොළඹ 2.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.